# ප්‍රාදේශීය අනන්‍යතාව නිරූපණ විෂයෙහි ලා පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මාන්තය

# The Regional Identity Displayed in the Textile and Lace Industries

අසිත මල්ලවආරච්චි[1], සහන් හේවාගමගේ[2]


දේශීය අනන්‍යතාව නිරූපණයෙහි ලා ඇඳුම ඉතාවැදගත් සාධකයක් ලෙස සැලකිය හැකිය. එය උඩරට හා පහතරට ප්‍රාදේශීය අනන්‍යතාව වෙන් වෙන්ව හඳුනාගත හැකි ප්‍රධානම සාධකය වේ. මෙම ප්‍රාදේශීය අනන්‍යතාව විදහා දැක්වීමේ දී අතීතයේ සිට මේ දක්වා ක්‍රමිකව විකාශනය වූ ඇඳුම, නිර්මාණ කරණයේ දී පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මාන්තය විශේෂ කොට දැක්විය හැකිය. එබැවින් ප්‍රාදේශීය අනන්‍යතාව නිරූපණ විෂයෙහි ලා පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මාන්තය තුළ පවතින විශේෂතා අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මාන්තය තුළින් නිර්මාණය වන රෙදිපිළි, ප්‍රාදේශීය අනන්‍යතාව නිරූපණය කරනවාද යන්න යි. එම ගැටලුවට ගොඩනගන ලද උපන්‍යාසය වූයේ, පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මාන්තය තුළින් නිර්මාණය වන රෙදිපිළි, ප්‍රාදේශීය අනන්‍යතාව නිරූපණය කරයි යන්න යි. මෙම පර්යේෂණය අධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික දත්ත ලෙස පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මන්තය ප්‍රචලිතව පවතින ප්‍රදේශවලට ගොස් එම කර්මාන්තයේ නියැලෙන්නන් සම්මුඛ වී ඔවුන්ගේ තොරතුරු ලබාගත් අතර ද්විතීයික දත්ත ලෙස පුස්තකාල පරිශීලනය, පුවත්පත්, සඟරා මෙන් ම අන්තර්ජාල ප්‍රකාශන පරිශීලනය කළේ ය. එම තොරතුරු, ඡායාරූප හා රූගත කිරීමෙන් අනතුරුව අත්‍යන්ත්‍ර පේෂකර්ම කර්මාන්තය හා රේන්ද කර්මාන්තය තුළින් නිර්මාණය වන රෙදිපිළි තුළින් ප්‍රාදේශීය අනන්‍යතාවය විදහා දක්වෙන වාර්තා චිත්‍රපටයක් නිර්මාණය කළේ ය. මෙහි දී අධ්‍යයන සීමාව ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ ඉහළ මඩම්පැල්ල ග්‍රාමය හා මාතර දිස්ත්‍රික්කයේ වැලිගම හා අහංගම යන ප්‍රදේශයන් තෝරා ගත්තේ ය.

මෙම පර්යේෂණයෙන් එළඹිය හැකි නිගමන වන්නේ ප්‍රාදේශීය අනන්‍යතාවය විදහා දක්වන ප්‍රධාන සාධකයක් ලෙස ඇඳුම පෙන්වාදිය හැකි අතර එයින් උඩරට හා පහතරට අනන්‍යතාව වෙනුවෙන් මෙම පේෂකර්ම හා රේන්ද කර්මාන්තයෙන් නිෂ්පාදිත රෙදිපිළි ඔස්සේ නිර්මාණය වන ඇඳුම් විලාසිතා දායකත්වය සපයනු ලබන බව යි. ඒ සඳහා භාවිත වර්ණ, හැඩතල රූප එහි නිර්මාණාත්මක ක්‍රමවේදය එම ප්‍රාදේශීය අනන්‍යතාවයන් තව තවත් ඔප්නැංවීමට දායකත්වයක් ලබාදෙන බව යි.



ප්‍රමුඛ පදඃ අනන්‍යතාව, කර්මාන්ත, ඇඳුම්

**Keywords:** Identity, Industries, Dresses


---


1 asithaprabhath@ymail.com

2 madusankasahan@gmail.com